අපේ අත්දැකීම්

දශක දෙකකට ආසන්න කාලයක් ඔස්ට්‍රේලියාවේ පවත්නා බහුසංස්කෘතික සමාජයක ජීවත්වීමෙන් ,එහි විවිධ අංශ නිරීක්ෂණය කිරීමෙන් හා විවිධ ක්‍රියාකාරකම්වල නියැලීමෙන් ලබාගත් දැනුම ආකල්ප හා කුසළතා ඔබ හා බෙදා හදාගැනීමඅපගේ අරමුණයි.

අපේ මව්බිමෙන් මෙහි සංක්‍රමණය වී සිටින එමෙන්ම සංක්‍රමණය වීමට බලාපොරොත්තු වන අපේ සහෝදර ජනතාවට යම්කිසි සුභවාදී පණිවිඩයක් ලබාදෙන්නට මෙසේ දොරක් විවෘතවීමම සතුටට කරුණක්.

මෙහි වෙසෙන ශ්‍රී ලාංකීය ජනගහණයේ සංයුතිය දෙස බලනවිට ප්‍රධාන වශයෙන් වෘත්තිකයින් ,ව්‍යාපාරිකයින් ,ශිෂ්‍යයින් හා සරණාගතයින් මූලික වන බවක් පෙනේ. පසුගිය වකවානුවල අප මව්රටේ ඇතිවූ දේශපාලනමය ,ආර්ථිකමය හා සමාජමය අස්ථාවර බව හා ගැටලු නිසා ශ්‍රී ලංකාවෙන් මෙහි පැමිණි ජනතාව අද සැනසිල්ලෙන් මෙහි ජීවත්වනු දැකීම ෂතුටට කරුනක්. මීට අමතරව තම දරුවන්ගේ අධ්‍යාපනය සාර්ථක කර ගැනීමේ එකම අරමුණින් මෙහි පැමිණ මෙහි ස්ථාපිතවූ තවත් කංඩායමක් ද ඇත.

මෙසේ ශ්‍රීලංකාවෙන් විවිධ අරමුණු ඇතුව මෙහි පැමිණි ජන කොටස් ජාතීන් අනුව සිංහළ ද්‍රවිඩ,මුස්ලිම් හා බර්ගර් වශයෙන් හැඳින්විය හැකිවුවත් අපි සියලුදෙනාම එක මවෙකුගේ දරුවෝ වෙමු. එකම රටක පුරවැසියෝ වෙමු. අප සියලු දෙනාටම පොදු අවශ්‍යතා ඇත. උදාහරණයක් වශයෙන් යහපත් අධ්‍යාපනයක් ,යහපත් සෞඛ්‍යයක්, සතුට, සැනසීම අප සැමටම අවශ්‍ය නොවේද?

මේ සමාජයේ  සුවිශේෂී ලක්ෂණ රාශියක් ඇති බව ඔබ දන්නවා ඇත.සමාජ ඒකාග්‍රතාවයට මුල්තැන දෙන මේ සමාජයේ ජාතීන් සිය ගණනක් ආගම් රාශියක් විවිධ ආචාර සමාචාර ඇ.ති සංස්කෘතින් සිය ගණනක් කිසිම ගැටුමක් නැතිව ජීවත්වන ආකාරය පුදුම සහගතයි. එකිනෙකාට ගෞරව කිරීම , නීතිගරුක බව රටේ සාමය තහවුරු කිරීමටත් ජාතීන් අතර සමගිය වර්ධනය කිරීමටත් බෙහෙවින් හේතුවී ඇත.

මෙරට සාර්ථක දිවියක් ගෙවීමට නම් අප විසින් කළ යුතු යමක් ඇත්ද අප මව්රටින් ගෙන ආ ඇතැම් මත ආකල්ප හා විශ්වාස වෙනස් කළ යුත්තේද අපේ දැක්ම කුමක් විය යුතුද මේ රටට අප විසින් දායකත්වයක් ලබාදියහැක්කේ කුමන අංශවලින්ද යන්න අප ගේ අවධානයට ලක්විය යුතු අතර මෙම කරුණු ගැන අප ඉදිරියේ දී සලකා බලමු